චක්‍රලේඛ අංක 02/2001

මගේ අංකය: බප/සසේකො/ලේ/නිර්/2001
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.
2001.09.28

බස්නාහිර පළාතේ සියලුම සමුපකාර සමිති
සභාපතිවරුන් වෙත,

## විනය පරීක්ෂණවලදී ගෙවීම

සමුපකාර සේවක කාර්ය විධිවිධාන සංග්‍රහයේ 5:10:1 සිට 5:10:5 දක්වා ඇති සියලුම වගන්ති ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් වගන්ති ආදේශ කිරීම සමුපකාර සේවක කොමිෂන් සභාව අනුමත කර ඇත. ඒ අනුව කටයුතු කරන ලෙස සියලුම සමුපකාර සමිතිවලට මෙයින් දැනුම් දෙනු ලැබේ.

5:10:1 විනයානුකූල පරීක්ෂණ පැවැත්වීම වෙනුවෙන් කරනු ලබන ගෙවීම් 2001.10.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු ය.

| ශ්‍රවනය ඉදිරිපත් කරන සේවකයාගේ වැටුප් පරිමාණය | පරීක්ෂණය පැවැත්වෙන පැයකට දීමනාව | ලිපිකරු/යතුරු ලේඛක සහාය තැපැල් ගාස්තු වශයෙන් වැයවූ මුදල් ප්‍රතිපූර්ණය කිරීම | අවසාන වාර්තාව පිළියෙල කිරීම |
|---|---|---|---|
| **පරීක්ෂණ නිලධාරී විශ්‍රාමික/ රාජ්‍ය සේවයේ සංස්ථා සේවයේ නියුතුවූවන්** | | | |
| අ. සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් අනුමත 1 සිට 10 දක්වා වැටුප් පරිමාණවල සේවකයන්ට එරෙහිව පැවැත්වෙන පරීක්ෂණ | රු.125 | රු. 500 | රු.2500 |
| ආ. සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් අනුමත 11 සිට 17 දක්වා වැටුප් පරිමාණවල සේවකයන්ට එරෙහිව පැවැත්වෙන පරීක්ෂණ | රු.100 | රු. 500 | රු.2500 |

සමුපකාර සමිතිය විසින් ලිපිකරු/ යතුරු ලේඛක සහාය හා තැපැල් ගාස්තු සපයනු ලබන්නේ නම් ඒ සඳහා වෙන්කර ඇති මුදල ලැබීමට හිමිකමක් නැත

11. විභාග පරීක්ෂණ නිලධාරී
<u>අදාල සමිතියේ සේවයේ</u>
<u>නියුතු වුවත්</u>

අ. සමුපකාර සංවර්ධන කොමසාරිස්
විසින් අනුමත 1 සිට 17 දක්වා
වැටුප් පරිමාණවල සේවකයන්ට
එරෙහිව පැවැත්වෙන පරීක්ෂණ — රු. 125

ආ. සමුපකාර සංවර්ධන කොමසාරිස්
විසින් අනුමත 11 සිට 17
දක්වා වැටුප් පරිමාණවල
සේවකයන්ට එරෙහිව පැවැත්වෙන
පරීක්ෂණ — රු. 100

111. <u>පැමිණිල්ල මෙහෙයවන නිලධාරීන්ට</u>
<u>ගෙවීම්</u>

අ. සමුපකාර සංවර්ධන කොමසාරිස්
විසින් අනුමත 1 සිට 10 දක්වා
වැටුප් පරිමාණවල සේවකයන්ට
එරෙහිව පැවැත්වෙන පරීක්ෂණ — රු. 100

ආ. සමුපකාර සංවර්ධන කොමසාරිස්
විසින් අනුමත 11 සිට 17 දක්වා
වැටුප් පරිමාණවල සේවකයන්ට
එරෙහිව පැවැත්වෙන පරීක්ෂණ — රු. 75

5:10:2 විභාග පරීක්ෂණ/ විධිමත් විභාග/ අභියාචනා පරීක්ෂණ යන තවර අවස්ථාවකදී
පැමිණිල්ල මෙහෙයවන නිලධාරියාට ගෙවීම් කළ යුත්තේ ඉහත 5:10:1 (
(අ) හෝ (ආ) වගන්තිවල සඳහන් පරිදිම ය.

5:10:3 ඉහත සඳහන් දීමනාවට අමතරව අභියාචනා පරීක්ෂණ නිලධාරියා/ පැ
මෙහෙයවන නිලධාරියා රජයේ හෝ සංස්ථා සේවයේ විශ්‍රාමිකයකු නම් ඔහු
යන විට දැරූ තනතුර පදනම් කර ගෙන ද රජයේ හෝ සංස්ථා සේවයේ
සේවයේ යෙදී සිටින නිලධාරියකු නම් ඔහු දරන තනතුර පදනම් කර
රජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට අනුකූලව ගමන් වියදම් හා
දීමනා ලබා ගැනීමට හිමිකම් ඇත. අභියාචනා පරීක්ෂණ නිලධාරියා / පැ
මෙහෙයවන නිලධාරියා සමුපකාර සේවයෙන් විශ්‍රාම ගිය නිලධාරියකු
විශ්‍රාම යන විට දැරූ තනතුර පදනම් කර ගෙන ද දැනට සමුපකාර සේ
නියුතු නිලධාරියකු නම් ඔහු දරන තනතුර පදනම් කර ගෙන ද සමුපකාර
කාර්ය විධිවිධාන සංග්‍රහයේ සඳහන් විධිවිධානයන්ට අනුකූලව ගමන් වියදම්
සංයුක්ත දීමනා ලබා ගැනීමට හිමිකම් ඇත.

5:10:4 විභාග පරීක්ෂණ නිලධාරියකු/ පැමිණිලි මෙහෙයවන නිලධාරියකු පරීක්ෂණය සඳහා නියම කළ ස්ථානයට නියමිත දින නියමිත වේලාවට පැමිණිය මුත් ඔහු එගතිව යුතු වන්නේ නැති විශේෂ කරුණක් පදනම් කර ගෙන එම පරීක්ෂණය වෙනත් දිනකට කල් තබන්නේ නම් සම්පූර්ණ සැසියක් සඳහා ගෙවිය යුතු මුදලින් එක් අඩක් ඔහුට ගෙවිය යුතු ය. සම්පූර්ණ සැසියක් යනුවෙන් හඳුන්වන්නේ පැය 08 ක කාලසීමාවකි. එහෙත් පරීක්ෂණය පැය 04 කට අඩු කාලයක් පවත්වා වෙනත් දිනකට කල් තබන්නේ නම් මෙම සහනය හිමි වන්නේ නැත.

5:10:5 විභාග පරීක්ෂණයක් සඳහා සම්පූර්ණ දිනකට ගෙවීම් දීමනා ලබා ගැනීමට නම් පැය 04 කට වැඩි කාලයක් නොකඩවා එම පරීක්ෂණය පවත්වා තිබිය යුතු ය. එසේ නොමැති නම් හිමි වන්නේ ගෙවීම් දීමනාවෙන් අඩක් පමණි. විභාග පරීක්ෂණය මාස 06 කට වඩා ප්‍රමාද කරන්නේ නම් ගෙවීමට නියමිත දීමනාවෙන් 50% ක් පමණක් ගෙවිය යුතු ය. එසේ විශේෂිත හේතුවක් පදනම් කර ගෙන පරීක්ෂණයේ වාර්තාව ලබා දීම මාස 06 කට වඩා ප්‍රමාද වන්නේ නම් සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ හා සමූපකාර සේවා කොමිෂන් සභාවේ ලිඛිත අනුමැතිය ඒ සඳහා ලබා ගෙන තිබේ නම් දීමනාවෙන් 50% ඉතිරිව ගෙවීම් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට බලය තිබේ.

ආර්.එච්. විමලවීර,
ලේකම්,
සමූපකාර සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත

1. බස්නාහිර පළාතේ සමූපකාර, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා ගේ සම්බන්ධීකරණ නිලධාරී
2. ප්‍රධාන ලේකම් (බ.ප.)
3. ලේකම් – සමූපකාර, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය (බ.ප.)
4. සමූපකාර සංවර්ධන කොමසාරිස් හා සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් (බ.ප.)
5. සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ, කළුතර, ගම්පහ)
6. ලේකම්, සමූපකාර සේවා කොමිෂන් සභාව
7. සියලුම පළාත් සමූපකාර සේවා කොමිෂන් සභා ලේකම්වරුන්
8. සියලුම වාණිජ සමිති සංගම්